# ධාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

36 වන කාණ්ඩය | 02 වන කලාපය | 2020 ජනවාරි


# කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තුරන් කරමු




**සෑම** වසරකම නොවැම්බර් මස 25 වැනිදා ජාත්‍යන්තර වශයෙන් සමරන කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට සිදු වන ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ ජාත්‍යන්තර දිනය ධාබිඳු සාමූහිකය විසින් මෙවරත් වව්නියාවේ නෙල්ලි ස්ටාර් හෝටලයෙදී පැවැත්විය. වව්නියා, කිලිනොච්චි හා ඕමන්තේ ප්‍රදේශවල ඇඟළුම් ක්ෂේත්‍රයේ නියුතු කම්කරු කාන්තාවන් 150 දෙනෙකු පමණ මෙම වැඩසටහනට සහභාගී විය. තවද සිවිල් සංවිධාන නියෝජිතයින් හා මධ්‍යවේදීන් ද මෙම අවස්ථාව සාර්ථක කර ගැනීම සඳහා සහභාගී විය.

එම අවස්ථාවේ දී "කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තුරන් කරමු" මැයෙන් සටන් පාඨ සමගින් විදීයට පැමිණ විශේෂයෙන් කම්කරු කාන්තාවන් ආයතන තුළදී මුහුණපාන ලිංගික හිංසකයන් පිළිබඳ ඔවුන්ගේ හඩ අවදි කරන ලදි. ධාබිඳු සාමූහිකයේ වැඩසටහන් සම්බන්ධීකාරිණී චමිලා තුෂාරි මහත්මිය විසින් පැමිණ සිටින්නන් පිළිගැනීමෙන් අනතුරුව ඇඟළුම් කර්මාන්තයේ සේවිකාවන්ට ආයතනය තුළ හා සිය නේවාසිකාගාර තුළදි, මඟතොට දී විඳින්නට සිදුවන ශාරීරික, මානසික හා ලිංගික හිංසනයන් පිළිබඳ සිය අත්දැකීම් බෙදාගන්නා ලදි.

9 වන පිටුවට...

## ඇතුළු පිටු


**03 පිටුව** - ඔබට හිමි ඔබේ වත්කම
**04 පිටුව** - සුව හා රුව
**05 පිටුව** - C-190 පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන/ හදිසි තීරණ ගන්න එපා
**06.--07 පිටුව** -කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඉතිරිය...
**08 පිටුව** - සිතුවිල්ල/ඔබට හිමි ඔබේ වත්කම
**09 පිටුව** - ප්‍රහේලිකා/ පබැඳුම
**10 පිටුව** - මොකක්ද මේ C-190


නිදහස් වෙළඳ කලාපයේ ඉපැරණිම පුවත්පත

## ඩාබිඳු සාමූහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka


# නව වසරේ අභියෝග හා ගැටළු

අප නව වසරකට පා තැබුවේ අළුතින් පත් වු නව ආණ්ඩුවක් සමඟයි. ශ්‍රී ලංකාව නිදහස ලබා වසර 71 ක ලද අත්දැකීම සමඟ නව ආණ්ඩුව පිළිබඳ නැවුම් බලාපොරෝත්තු කෙසේ වුවද ආර්ථික ප්‍රතිපත්ති ජනතාවට සුභවාදී ලෙස භාවිතා කරනු ඇතැයි අප සිතමු.

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින් ලැබු සේවා ප්‍රතිලාභ හා කොන්දෙසි වල කප්පාදු කිරීම් පිළිබඳ පසුගිය දින වල කණින් කොණින් ඇසුනත් පසුගිය වසර පුරාවට තේ වතු කම්කරුවන්ගේ ඉල්ලීම් සළකා බලා දෛනික වැටුප රු.1,000 කිරීමට ගත් උත්සහය පිළිබඳ සතුටු විය යුතුයි. එසේම රටට විදේශ විනිමය උපයන ඇඟළුම් ක්ෂේත්‍රයේ අවම වැටුප රු.25,000ක් විය යුතු බවට කරන වෘත්තිය ඉල්ලීම පිළිබඳව රජයේ අවධානයට වහා වහා ලක් විය යුතු බවද මතක් කළ යුතුව ඇත.

රටක් ජාතියක් ලෙස මේ වන විට පත්ව ඇති ආර්ථික අර්බුදයට විසදුම් සෙවීම නව රජයට ඇති බලවත් වු අභියෝගයකී. ලබාගත් ණය වලට අනුව 2020 වන විට එම ණය වාරිකය ට්‍රිලියන එකක් පමණ වේ. මේ මොහෙතේ ඒවා පියවීමට තියෙන එකම විකල්පය වන්නේ තවත් ණය ගැනීමෙන් පමණි. මේ වන විට අප ණය බරින් ඇමරිකාවට ගොදුරු වී හමාරය. ඒ සමඟම MCC ගිවිසුම අත්සන් කිරීමට ද සැරසේ. මහජනතාවගේ, රටේ සංවර්ධනය උදෙසා ණය ගැනීම අවශ්‍ය වුවද මෙතෙක් සිදු වුයේ බදු හා ණය වල මහජනතාව සෘජු ගොදුරු බවට පත් වීමයි.

තවමත් රජය වියදම් වැඩ වලට මුලිකත්වය දෙමින් කටයුතු කරන නිසා ආදායම් උත්පාදනය කරන වැඩ වලට අවධානය යොමු කොට නැත. එම නිසා මේ ආර්ථික අර්බුදයේ බර ජනතාව පිට පැටවීම හැර වෙනත් ක්‍රියාමාර්ගයක් නැත. පසුගිය 71 වසර තුළම සිදු වී ඇත්තේ කිහිප දෙනෙකු විසින් මේ රටේ සාරය උරා බී හප කොට දැමීමයි.

මේ නිසා රජයට අභියෝග රැසකට මුහුණ දීමට සිදුව ඇත. ඡන්ද පොරොන්දු සේම ප්‍රජාතාන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ තුළින් සංවර්ධන ක්‍රියාවලියකට යා යුතුය. බහුතරයක් වු කාන්තාවන්, ළමයින් මුහුණ පාන ගැටළු දිනෙන් දින වර්ධනය වේ. අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය ඇතුළු දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික ගැටළු කෙරෙහි නව මුහුණුවරකින්, නව චින්තනයකින් බැලිය යුතුය.

මේ පිළිබඳ සියළු දෙනා එකාවන්ව අත්වැල් බැඳ ගත යුතුව ඇත. බලයට පත් ආණ්ඩුව මෙන්ම ප්‍රබල විපක්ෂයක කාර්යභාර්යද ශක්තිමත් කරගත යුතුව ඇත.

# ඇය සිතන්නට යමක්...

තොට්ල්ල පදවන දෑත ලෝව ආණ්ඩු කරවයි යන ප්‍රසිද්ධ කියමනක් ඇතත් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 52%ක් පමණ වන කාන්තා ප්‍රතිශතයෙන් දේශපාලනයට හෝ ප්‍රතිපත්ති සම්පාදනය කරන්නා වු තැන් වල සිටින්නේ ඉතාම අල්ප ප්‍රමාණයකී. රටේ සමස්ථ ඡන්ද ප්‍රතිශතයෙන් වැඩි ප්‍රමාණයක් කාන්තාවන්ගෙන් හිමි වුවත් වුවත් පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට හෝ දේශපාලනයට පිවිසීමට ස්ත්‍රීන්ට පහසු කාර්යයක් නොවේ. දේශපාලනයට සම්බන්ධ වීමට හෝ එවැනි අපේක්ෂිකාවක් ලෙස කටයුතු කිරීමට කාන්තාවන් උත්සුක වුවත් පිරිමි පාර්ෂවයේ බලපෑම් හෝ වෙනත් කරණා මත එම අවස්ථාවන් මඟ හැරි යනු ඇත.

අද වනවිට ලෝක ජනගහනයෙන් අඩක් වන කාන්තාවන් ලෝක ශ්‍රම බලකායෙන් සියයට 40ක් පමණ නියෝජනය කරයි. ආර්ථික සංවර්ධනයෙහිලා ඔවුන්ගේ දායකත්වය කොතෙක් පුළුල් වී පවතී ද යත්, රැකියා නියුක්තියේ කාන්තා දායකත්වය ඉහළ යෑම රැකියා වනිතාකරණයක් ලෙස හඳුන්වයි. ඇතැම් රටවල සමාජ, සංස්කෘතික හා දේශපාලන හේතු මත කාන්තා ශ්‍රමයෙන් නිසි ඵල නෙලා නොගත්ත ද බොහෝ රටවල කාන්තා ශ්‍රමය ආර්ථික සංවර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් කොට ගෙන තිබෙනු දක්නට ලැබෙයි. විධිමත් හා අවිධිමත් යන දෙඅංශයෙහි ම කාන්තා ශ්‍රමයෙහි දායකත්වය වසරින් වසර පුළුල් වෙමින් තිබේ.

වැටුප් රහිත සුරැකුම් ක්ෂේත්‍රයේ නියැලෙන එනම් නිවසේ සිට එදිනෙදා තම පවුල් සංස්ථාව වෙනුවෙන් කටයුතු කරන කාන්තාව රටේ දළ දේශිය නිශ්පාදනයට හෝ ආර්ථිකයට දක්වන සෘජු හෝ වක්‍ර දායකත්වය පිළිබඳ ආර්ථික වටිනාකමක් හෝ පිළිගැනීමක් සිදු නොවේ.

ස්ත්‍රීය දූ දරුවන් හදාවඩා ගනිමින් කුටුම්භයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කළ යුතු යැයි නීතිමය වශයෙන් පැවරී නොතිබුණත්

11 වන පිටුවට...

# ඔබට හිමි ඔබේ වත්කම



ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ ශ්‍රමිකයන් හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුම කරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කරන ලදි. මෙම අරමුදලෙහි පරිපාලනය කම්කරු කොමසාරිස් ජනරාල් / කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර එහි මුදල්වල භාරය මුදල් මණ්ඩලය / ශ්‍රීලංකා මහබැංකුව විසින් දරණු ලැබේ.

අරමුදලේ පසුගිය වර්ෂ තුළ වාර්ෂික පොළී අනුපාතය 10%කට වඩා ඉහළ අගයක රඳවා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව සමත් වී ඇත. එමෙන්ම මෙම පොළිය වැල් පොළිය වශයෙන් අඛණ්ඩව සාමාජිකයාගේ ශේෂයට එකතු වේ. සේවකයාගේ මාසික මුළු ඉපයීම්වලින් අවම වශයෙන් 12%ක් සේවායෝජකයා විසින් 8%ක් සේවකයා විසින්ද සේවක අර්ථ සාධක අරමුදලට දායක බැවින් සෑම මසකම සේවකයාගේ මුළු ඉපැයීම් වලින් 1/5ක් වැනි විශාල අගයක් සාමාජිකයාගේ විශ්‍රම දිවිය සුරක්ෂිත කිරීම සඳහා යෙදවේ.

වර්තමානය වන විට සේවක අර්ථසාධක අරමුදල ලංකාවේ පවතින විශාලතම සමාජ ආරක්ෂණ ක්‍රමය බවට පත්ව වටිනාකම රුපියල් ට්‍රිලියන 2ක් පමණ වේ. 2017 වර්ෂයේදී සේවක අර්ධසාධක අරමුදල් ලැබීම් රුපියල් බිලියන 133ක් වන අතර ප්‍රතිලාභ නිකුත් කිරීම සඳහා රුපියල් බිලියන 117ක් වැය වූ බවට ශ්‍රී ලංකා මහ බැංකු දත්ත මගින් පෙන්වා දී ඇත.

අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු මේ වන විට විමධ්‍යගත කිරීම් තුළින් සාමාජිකයන් හට ප්‍රතිලාභ ලබා ගැනීම වඩාත් පහසු කොට ඇති අතර, අරමුදලේ සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය යටතේ ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනා ගැනීමටත්, ප්‍රතිලාභ ගෙවීමේදී සිදුවිය හැකි අපහසුතාවයන් අවම කිරීමට හැකි වාතාවරණයක් උදාකර ගැනීමටත් කටයුතු කරමින් පවතී.

## සේවක අර්ථසාධක අරමුදල් අංශයේ ප්‍රධාන කාර්යයභාරය

සිය මානව හා නීතිමය අවශ්‍යතා ඉටු කරමින් සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවීමට සේවායෝජකයා හට පහසුකම් සැලසීම සඳහා සේවක අර්ථසාධක අරමුදලෙහි ආයතන ලියාපදිංචිය හා සේවායෝකජයාගෙන් සේවක අර්ථසාධක දායක මුදල් අයකර ගැනීම, කාර්යක්ෂම හා සඵලදායි කළමනාකරණයක් තුළින් අරමුදලේ සාමාජිකයන් හට සේවක අර්ථසාධක අරමුදලෙහි ප්‍රතිලාභ ගෙවීම.

## ඔබ සේවකයකු නම්...

සේවක අර්ධසාධක අරමුදලට දායක වීමෙන් සෑම මසකම මුළු ඉපැයීම් වලින් 1/5 ක් වැනි විශාල අගයක් හා එයට එකතුවන ඉහළ වැල් පොළිය ඔබගේ විශ්‍රම දිවිය සුරක්ෂිත කිරීම සදහා යෙදවේ.

8 වන පිටුවට...



# සුව සහ රැව

## නහර ගැට ගැසීමේ රෝගය යනු

සෑම සත්වයෙකුගේම සිරුරේ රුධිරය ගමන් කිරීම සඳහා රුධිර නාළ වර්ග දෙකක් තිබෙනවා. සාමාන්‍යයෙන් පිරිසිදු රුධිරය ගමන් කරන්නේ ධමනි වලින්. අපිරිසිදු රුධිරය ගමන් කරන්නේ ශිරා මඟින්. මෙම ශිරා ඉදිමීම නහර ගැට ගැසීමේ රෝගයයි.

## මෙම රෝගය සිරුරේ කුමන කොටස්වල ඇතිවේද ?

මෙම තත්වය ප්‍රධානව පාද ආශ්‍රිතව ඇති වේ. පාදයේ කෙණ්ඩ ප්‍රදේශයේ හා කලව ප්‍රදේශයේ බහුලයි. මේවා පාදයේ පිටුපස හෝ දෙපස ඇතිවෙනවා. එකට බලපාන හේතු බොහොමයක් තිබේ. අර්ශස් රෝගයත් පිරිමි අයගේ වෘෂණ ආශ්‍රිතවත් සිරුර අභ්‍යන්තරයේ ගලනාළය හා අමාශය සම්බන්ධ වන කොටසෙන් මෙම නහර ගැට ගැසීම ඇති වේ.

## මෙම රෝගය ඇතිවීමට හේතු මොනවාද ?

පොදුවේ ගැහැණු අයට මෙම තත්වය බහුලව ඇතිවෙනවා. දිගු කාලීනව සිටගෙන සිටීම, ශරීරයේ බර වැඩිවීම, අධික උසවීම කාලීන මලබද්ධය, කැස්ස වැනි රෝග නිසා උදරයේ පීඩනය වැඩිවීම, වයසට යාමේදී නහර දුර්වල වීම, ගර්භණී සමයේ ඇති වී විටෙක මෙය දිගුකාලීනව පවතී. පවුලේ මෙවැනි රෝග තිබීමත් මෙයට හේතුවක් වෙනවා.

## නහර ගැට ගැසීමේ දී සිරුර තුළ සිදුවන්නේ කුමක්ද ?

නහර වල ලේ ගමනාගමනය ක්‍රමවත්ව සිදුකිරීමට ඇති කපාට නිසිලෙස නොවැසීමත් රුධිර නාළවල බිත්ති දුර්වල වීමත් නිසා රුධිරය ඉහළට තල්ලු කිරීම දුර්වල වේ.

## නහර ගැට ගැසුණු විට ඇති ලක්ෂණ මොනවාද ?

නහර ඉදිමීම, නහර ඉල්පී කැපී පෙනීම. නහර ගැටිති සහිත වීම, ඉදිමීම, වේදනාව, කැසීම, කළුවීම, දැවිල්ල, පාද වල බර බව, රාත්‍රියට මස් පිඬු පෙරළීම, පාද හිරිය, තුවාල ඇති වීම.

## නහර ගැට ගැසීම වළක්වා ගන්නේ හෝ පාලනය කර ගන්නේ කෙසේද ?

මෙය ක්‍රම දෙකකින් සිදුකළ හැකිය. කෙටි කාලීනව පාද එල්ලාගෙන සිටීම අවම කිරීම, දිගු කාලීනව හිටගෙන සිටීම අවම කිරීම, නිතර ඉහළ පහළ ගමන් (පඩිපෙළ) අවම කිරීම, නිදන ඇඳේ පාද දමන පැත්ත අඩි 1/2 පමණ ඔසවා තැබීම, ක්‍රෙප් බැන්ඩේජ, හෝ මේස් පැළඳීම, රාත්‍රියට නින්දට පෙර පාද පරීක්ෂා කිරීම, තුවාල ඇත්නම් ප්‍රතිකාර ලබා ගැනීම. දිගු කාලීනව සරිලන බර පවත්වා ගැනීමට ආහාර පාලනය කිරීම, නිසි වේලාවට ආහාර ගැනීම, ව්‍යායාම කිරීම, ජලය ප්‍රමාණවත්ව පාලනය කිරීම, සිරුරේ පිරිසිදු බව රැකගැනීමට ආහාර පාලනය කිරීම, නිසි වේලාවට ආහාර ගැනීම, ව්‍යායාම කිරීම, දිගු කාලීනව මලබද්ධය වැනි රෝග වලට ප්‍රතිකාර ගැනීම, ලේ පිරිසිදු කරන ආහාර පාන, ඖෂධ ලබාගැනීම, වයසට යාමේදී ඇතිවන නහර දුර්වලතා වැළැක්වීමට රසායන කර්ම කිරීම කළ හැක.

අන්තර්ජාලය ඇසුරෙනි

# C-190 පිළිබඳව ගුවන් විදුලියෙ දී







**ඉහත** මාතෘකාවට සම්බන්ධ ගුවන් විදුලි වැඩසටහනක් ස්වදේශී සේවයේ පසුගිය දෙසැම්බර් 19 වැනිදා NUSS වෘත්තිය සමිතිය විසින් සංවිධානය කර තිබුණු අතර ඒ සඳහා ධාබිඳු සාමුහිකයේ චමිලා තුෂාරි මහත්මියට සම්බන්ධ වීමට අවස්ථාව හිමි විය.

මෙහිදි විශේෂ අවධානය යොමු වුයේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් හඳුන්වා දෙනු ලැබූ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් ව සිදුවන ලිංගික හිංසනයන් සම්බන්ධවය. එහිදී ILO සංවිධානය විසින් හඳුන්වාදුන් ප්‍රඥප්තිය සම්බන්ධව එනම් වැඩ ලෝකය තුළ සිදුවන ලිංගික හිංසනය හමුවේ බහුතරයක් වු කාන්තාවන් අත් විඳින කටුක අත්දැකීම් සාකච්ඡාවට බඳුන් වු අතර ඒහැර නීතිමය තත්වයන් පිළිබඳව NUSS නියෝජනය කරමින් පබා දේශප්‍රිය මහත්මිය විසින් කරුණු පැහැදිලි කිරීමක් කරන ලදි.

ධාබිඳු වසර 35 ක අත්දැකීම් තුළ විශේෂයෙන් ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තාවන් ඔවුන්ගේ රැකියාව නිසාම රට තුළ සංක්‍රමණය වී, සිය රැකියාව නිසාම විඳින්නට සිදු වන හිංසනයන් සම්බන්ධව මෙහිදී විශේෂ අවධානයට ලක් විය.

ආයතනය තුළ යන්ත්‍ර අලුත්වැඩියා කරන්නන්ගේ සිට මඟතොට, බස් රථයේ හා නේවාසිකාගාරයේ දී පවා තම සමීපතමයින්ගෙන් සිදුවන ලිංගික හිංසනයක් සම්බන්ධව මෙහිදී වැඩි අවධානයට යොමු වු අතර මෙම සම්මුතිය අපරානුමත කිරීම අප සැමගේ වගකීම වන බවද ඊට වගකීව යුතු නිළධාරීන්ගේ අවධානයට ලක විය යුතු බවද කම්කරුවන් මේ පිළිබඳව දැන්වත් කළ යුතු බවද තොරතුරු එකතු කිරීමේ හා අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයන් මේ තුළ අනුගමනය කරමින් මෙම සම්මුතීන් ප්‍රයෝගික තලයේ භාවිතා කිරීමට අවස්ථාව සකසා ගැනීම  පිළිබඳව මෙහිදී වැඩි අවධානයට ලක් විය.

# හදිසි තීරණ ගන්න එපා..

**සොයුරියනේ** සොයුරනේ... සුබ නව වසරක් වේවායි ඔබ සියලු දෙනාට පතමු... දැන් ඔයාලා කලාපය තුළ රැකියාවට පැමිණ වසර කීයක් ගත වී ඇද්ද...? වයස කීයද...? මේ වෙද්දි සිය ජීවිතයේ වටිනාම තීරණ කීයක් අරගෙන තියෙනවාද...? ඒ ගත්ත තීරණ තුළ ඔබලාගේ ජීවිතේ කොපමණ දුරට සාර්ථක වෙලා තියෙනවාද නැද්ද කියන එක පොඩ්ඩක් සිතා බලන්න...

අසීරුතා රාශියක් මැද ඕන තරම් තීරණ අරගෙන ඇති.. නමුත් ඒ ගත්තා වු තීරණ නිසා හොඳ වගේම නරක දේවලුත් ජීවිතේට ලැබිලා ඇති... සමහර විට ඒ ගත් තීරණ නිසා සතුටු වුනාට වඩා වේදනාවට පත් වු අවස්ථා වැඩිවෙන්න පුලුවන්... ඒ ගැන සිතා වදවෙන්න එපා... නව තීරණ ගෙන ඒවා ඉෂ්ට කර ගැනීමට සිතන්න...

ජීවිතයට ලැබෙන හැමදේම අභියෝගයක් විදියට බාරගන්න... පසු තැවීම, ඕනාවට වඩා සිතන එක නවතා ලැබු නව වසරේදීවත් අතපසු වු කරණා ඉෂ්ට කර ගන්න මන්ද තව සුළු කාලයක් කාලාපය තුළ රැදි සිටිමට සිතා සිටින බැවිනි... ජීවිතය තියෙන්නේ විඳින්න මිස විඳවන්න නෙවෙයි...

කලාපය තුළ රැකියා කරන විට විවිධ ප්‍රශ්ණ ගැටලු වලට මුහුණ පෑමට ඔබලාට නිරතුරුව සිදු වේ... ඒවා නිරාකරණය කර ගැනීමට ඔබ ශක්තිමත් විය යුතුයි... ඕනැම තීරණයක් ගත් පසු අනේ දැන් එහෙම වෙයි මෙහෙම වෙයි... අයියෝ අපරාදේ කියා සිතට එන එක සාමන්‍ය දෙයක් සිතන්න ගියොත් තමයි ප්‍රශ්ණ මොකද කෙනෙක් තනිව හිතලා තීරණය ගන්නේ නැතුව තව යෙහෙළියකගෙන් හරි නැතිනම් දෙමාපියන් සමඟ සාකච්ඡා කර තීරණ ගන්න...

ආයතන තුළ විසඳා ගැනීමට ප්‍රශ්ණ ඇත්නම් ඒ ගැන අදාල අංශ වලට යොමු කර විසදුම් ලබාගන්න. හිත වෙනස් වන ගානේ නම් නැති ප්‍රශ්ණ ඇති වෙනවා. එක සිතකින් ගත් තීරණ කර ගන්න උත්සහ දරන්න. මේ වසරේදීවත් එය අධිෂ්ඨාන කර ගන්න...

එච්. අයි.සමන්මලී

1 පිටුවෙන්... **කාන්තාවන්ට එරෙහි...**










එසේම දින 16 වැඩපිළිවෙළ යටතේ මේ මොහොතේ ලොකයේ විවිධ මට්ටමින් පවත්වන බවද ඇය විසින් පවසා සිටියාය.

ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයන් සම්බන්ධව සංඛාලේඛණ පිරික්සීමේ දී ලැජ්ජාව හා බිය නිසා ඒවා වාර්තා නොකරන නිසා සොයාගැනීම අපහසු බවද 2016 පොලිස් වාර්තාවන්ට අනුව 3300 පමණ වාර්තා වී ඇති බවද ලංකාවේ 1/4 දෙනෙකු ලිංගික අතවර වලට භාජනය වී තිබෙන බවද ඇය විසින් පවසන ලදි, එසේම ප්‍රවාහනයේ දී 95% ක් ද විවාහක කාන්තාවන්ගෙන් 17% මේ හිංසනයන්ට ලක් වන බවත්, මේ නිසා දික්කාසාද වන බවද, යාපනය කිලිනොච්චිය, මඩකලපුව දිස්ත්‍රික්ක වල ස්ත්‍රී ප්‍රචණ්ඩත්වයට පත් වන කාන්තාවන්ගේ වැඩි වශයෙන් සිටින බවද වාර්තා වී ඇති බව වැඩිදුරටත් අදහස් දක්වමින් ඇය විසින් පවසා සිටින ලදි. සේවා ස්ථානයේ දී කාන්තාවන් ලක් වන හිංසනයන් පිළිබඳ මෑතක දී සම්මත කරන ලද C- 190 ප්‍රඥ්ඥාප්තිය පිළිබඳ පැහැදිලි කිරීම චමිලා තුෂාරි මහත්මිය විසින් පැහැදිලි කරන ලදි.

එදින ප්‍රධාන ආරධිත දේශණය සඳහා Mannar Womens Devolopment Fedaration ආයතනය නියෝජනය කරමින් මහලක්ෂ්මි කිරුශාන්තන් මහත්මිය සහභාගී විය. පළමුව ඇය විසින් මේ අවස්ථාවට සහභාගී වීමට අරාධනා කිරීම වෙනුවෙන් ඩාබිඳු සාමූහිකයට ස්තුති කිරීම සිදු කළාය.




මෙම ප්‍රචණ්ඩත්වය සැමරීමේ ඉතිහාස කතාව ඇය විසින් සභාවට පැහැදිලි කළ අතර අතීතයේ ඩොමිනික් සමූහ ආණ්ඩුවේ දේශපාලනයට පැමිණි කාන්තාවන් 3 දෙනෙකු ඝාතනය කිරීම හා ඔවුන් වෙනුවෙන් විශාලතම උද්ඝෝෂණයක් නොවැම්බර් 25 වැනි දින පැවැත්විණි. ස්ත්‍රීන්ට මෙවැනි ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමට සිදු වන්නේ ඇයි? එයට හේතුව ස්ත්‍රීය තුළ බලයක් නොමැති බව සිතන හෙයින් ගැහැණිය පහසුවෙන් බලහත්කාරකම් වලට ලක් වෙනවා.එයින් මිදෙන්න බෑ. ස්ත්‍රීයක් ප්‍රචණ්ඩත්වයක් ලක් වුවහොත් සමාජයක් අපි ඒ සම්බන්ධව ප්‍රශ්ණ කරන්නේ නැහැ. ගැහැණියක් විදින දුක් මැසිවිලි ගණන් කරන්න බැහැ. ස්ත්‍රීයට යම් දෙයක් සිදු වුවහොත් එය එළියට සමාජයට යන්නේ නැහැ. ගැහැණියකගේ ඇඳුම් පැළඳුම් තුළින් ඇය විවිධ තත්වයන් වලට ලක් කිරීම ඇයට අපහස කිරීම සමාජ සංස්කෘතිය තුළ ඇයව සිර කිරීම අදටත් මේ රටේ සිදුවන දෙයක්. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ තීරණ ගැනීමේ අයිතිය ඇයට දිය යුතුයි. දේශපාලනය තුළත් ස්ත්‍රී නියෝජනය වර්ධනය විය යුතු බව ඇය පැවසිය.

මහලක්ෂ්මි මහත්මිය විසින් ගෘහය තුල කාන්තාවන්ට සිදු වන හිංසනයන් මෙන්ම, සේවා ස්ථානයෙදී හා පොදු ප්‍රවාහන සේවයේ දී කාන්තාව නිරතුරුවම ලක් වන පීඩාවන්, හිංසනයන් පිළිබඳව ද ස්ත්‍රී සතු වගකීම් නිසාම ඇය ලක්වන පීඩාවන් වසන් කරමින් කල්ගත කිරීම ද ඇයගේ සමාජ ක්‍රියාකාරීත්වයට එය ප්‍රබල ලෙස බලපානු ලබන බව ඇය එහිදී කියා සිටියේය.

7 වන පිටුවට...

## 6 පිටුවෙන්... කාන්තාවන්ට එරෙහි...




විශේෂයෙන්ම ලාංකීය සමාජයේ කාන්තාවන් විවිධ මට්ටමින්, විවිධ මුහුණුවර යටතේ හිංසනයන්ට මුහුණ දෙන අතර විශේෂයෙන් කුඩා කාලයේ දරුවන් අතවරයට ලක්වීම, ස්ත්‍රී දූෂණ, ගබ්සාවන්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, රැකියාව කරන ස්ථානයේදී සිදුවන හිංසනයන්, මගී ප්‍රවාහනයේදී සිදුවන අතවරයන්සේම පිරිමි පාර්ශවයේ කුමන හෝ ආකාරයක හිංසනයකට ගොදුරු වීමට ගැහැනියට තිබෙන ඉඩකඩ වැඩි බවත්. පවුල තුළ ගැහැණු දරුවන්ට වෙනස්කොට සැළකීම දක්නට ලැබෙන කාරණයක් වන අතර. ඔවුනට බත්පත බෙදා දීමේ පටන්ම පිරිමි දරුවන්ට වැඩි සැලකිල්ලකුත් ගැහැනු දරුවන්ට අඩු සැළකිල්ලකුත් දක්වන ග්‍රාමීය සමාජ තවදුරටත් ලංකාවේ පවතින බව තවදුරටත් අදහස් දක්වමින් ඇය විසින් පවසා සිටියේය.






එසේම එහි ඇති වැදගත් කම හා කම්කරු කාන්තාවන් හට එම ප්‍රඥප්තිය අපරාන මත වීම නිසා සේවා ස්ථානයේ ඇයට විඳින්නට සිදු වන හිංසනයන්ට එරෙහිව බලපෑම් කිරීමට ඇයට අයිතියක් හිමි වේ. ඉන් අනතුරුව පොදු සාකච්ඡාව සඳහා කම්කරුවන්ට අවස්ථාව හිමි විය. මෙහිදි කිලිනොච්චි ප්‍රදේශයේ නියෝජනය කරමින් පැමිණි තරුණ කාන්තාවන් පවසා සිටියේ මේ වසරේත් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සැමරීම හා දැනුම ලබා දීම මෙවැනි ක්‍රියාකාරකම් සිදු කිරීමට ඔවුන්ව සම්බන්ධ කර ගැනීම පිළිබඳ බොහෝම ස්තුතියි වන බවත් ඇය පවසා සිටියාය.



එසේම වව්නියා ප්‍රදේශයේ නියෝජනය කරමින් පැමිණි කම්කරු කාන්තාවන් පවසා සිටියේ තමන්ගේ වැඩපළ තුළ හිංසනයන් රාශියක් ඇති නමුත් ඒවා ඉදිරිපත් කිරීම වෙනුවට සිදුවන්නේ දිනෙන් දින යටපත් වීම බවයි. එසේම ඩාබිඳු සාමුහිකය තුළින් විශාල වශයෙන් ප්‍රයෝජන තමන් ලබා ගත් බවත්ය. එසේම වව්නියා දිස්ත්‍රික් සම්බන්ධීකාරක පවසා සිටියේ යුද්ධයෙන් අනතුරුව ඩාබිඳු සාමුහිකය එම ප්‍රදේශයන් වෙත පැමිණ සිදු කරන්නා වූ මෙහෙය තව දුරටත් මේ කම්කරුවන් සමඟ දිර්ඝ කාලයක් සිටිමින් කටයුතු කිරීමට හැකි වේවායි ඔහු විසින් පවසා සිටියාය..



# සිතුවිල්ල

නත්තල් නිවාඩුවට ගමේ ගිහින් සිටි නිසා සෝමාගේ බෝඩිම පැත්තේ යන්නත් බැරි වුනා. පොළට ගිහින් එන ගමන් සෝමාගේ බෝඩිමට ගොඩ වුයේ ලැබූ නව වසර සුභ වේවායි පතමිනි... කෝ අපේ ගැන්සිය ඔයා විතරද අද බෝඩිමේ ඉන්නේ එයා බසාර් පැත්තේ ගියා. ගමේ ගිහින් ආව නිසා අතේ පිච්චියක්වත් නෑ. මම ඔහේ ඇඳට ගුලි වෙලා සිටියා වෙන මොනවා කරන්නද හරිම පාලුවක් දැනෙනවා... ගමේ ගිහින් ආවට පස්සේ. පාලුව යන්නත් එක්ක සෙට් කර ගනින් කොල්ලෙක් එවිට ඔය පාලුව කාන්සිය මඟ හරවා ගන්න පුලුවන් අනේ ඔව් මට එච්චරයි අඩු... මේ කලාපයේ දැන් ඉන්නවාද බං අවංකව ආදරය කරන අය. සිටියත් අතලොස්සක්. ජොලියට තමයි බොහෝ අය ඉන්නේ...

ගමේ ගිය වේලාවේ අම්මාත් කීවා උඹ කාලාපේටම තැත් ගැහැනේනද හඳන්නේ කල දවසත් ගෙවිලා යනවා බලපන් උඹේ ඇඟේ හැටි කට්ට තමයි බන්ඳලා දෙන්න වෙන්නේ ගාමන්ට් යන විට තිබුණු රුව කෝ දැන් කටු බෝඩියක් විතරයි ඉතුරු වෙලා තියෙන්නේ. උඹලා ඉතින් සෙල්ලම් බත් උයනවා වගේ පොඩි මුට්ටි පොඩ්ඩක බත් උයලා එකක් හදන් කනවා ඉතින් උඹලාට මන්දපෝෂණය හැදෙන්නේ නැතුව තියෙයිද...

අර පුස් බාස්කට් සමීක්ෂණයක් කරනවා කියලා කීවා නේද උඹ, එකෙන් මොනවාද කරන්නේ... පුස් නෙවෙයි ෆුඩ් බාස්කට් කියලා, අපි මාසයකට කරන වියදම්, කන බොන හැටි ගැන. ආ එකද අර උඹලා මන්දපෝෂණය කියලා කියන්නේ...

අනේ මන්දා බං උඹලෑ අම්මා කියන කතාවත් ඇත්ත තමයි...කී කාලයක සිට ඔයත් මේ කලාපය තුළ තපිනවාද... දැන්වත් අනාගතය ගැන හිතන්න... අර්ථසාධකයවත් ඉතිරි ඇතිනේ... ඉස්සර නම් කලාපේ වැඩ කරන්න කැමති අය බඳින්න කැමති නෑ...දැන් නම් කැමති වෙයි අර්ථසාදකය තියෙන නිසා... තව ඇතිනේ වැඩපළෙන් ලැබුණු විදුලි භාණ්ඩ... සිට්ටු සල්ලි ඒ ටික එකතු උනාම මල්ල කරේ...

දැන් ඉතින් අලුත් රජයක්නේ තියෙන්නේ අපි ගැනත් බලයිනේ නේද... අඩුම තරමින් පඩිය වත් වැඩි කරලා කන බොන අත්‍යාවශ්‍ය දේවල් වල වත් ගාණ අඩු කරනවානම් තව ටික කලක් රැදෙන්න තිබුණා කොන්ද බේරාගෙන... රක්ත හීනතාවයෙන් පෙළෙන්නේ නැතුව...

අනේ ඔව් පැටියෝ මටත් මේ ගෙන්දගම් පොළවේ ඉන්න නැතුව යන්න ඇත්නම් අසික තමයි...

සමන්තා

3 පිටුවෙන්... **ඔබට හිමි ඔබේ...**

**එබැවින් ඔබ**

- ස්ථිර, ආධුනික, තවකාලික හෝ අනියම් ලෙස සේවය කළත්
- කැලි ගනණට, කොමිස් ක්‍රමයට, කොන්ත්‍රාත් ක්‍රමයට හෝ වැඩ ප්‍රමාණය අනුව ගෙවීම් ලැබුවත්
- මාසික, අර්ධමාසික, සතිපතා හෝ දවස් පඩි ලැබුවත්
- සේ.අ.අ. ප්‍රතිලාභ මුදල් වරක් ලබා ලැනීමෙන් පසු නැවත රැකියාවේ යෙදෙන සේවකයෙක් වුවත් මෙරට රැකියාවල නියුක්ත විදේශිකයෙක් වුවත්
- සේවකයන් 10 දෙනෙකුට වැඩි පුණ්‍යායතන හා සමාජ සේවා කටයුතු සඳහා පවත්වාගෙන යනු ලබන ආයතනවල සේවකයෙක් වුවත්
- කම්කරු ශ්‍රේණිවල සිට කළමණාකරණ ශ්‍රේණි දක්වා ඕනෑම තරාතිරමක සේවය කළත් අරමුදලේ සාමාජිකයෙකු ලෙස ලියාපදිංචි වන්න.
- ඒ සඳහා A.B.H. ආකෘති පුරවා ඔබ සේවය කරන ආයතනය මඟින් සහතික කර ළඟම පිහිටි කම්කරු කාර්යාලයට භාර දෙන්න. මෙය සේවයට බැඳී දෙසතියක් තුළ සිදු කළ යුතුයි.
- එම ලියාපදිංචි ආකෘති පත්‍ර ඔබ සේවයට බැඳී දෙසතියක් තුළ සේව්‍යා කම්කරු දෙපාර්තමේන්තුවට භාර දී තිබේද, කම්කරු දෙපාර්තමේන්තුව එය ලියාපදිංචි කර තිබේද යන්න සොයා බලන්න.
- ඔබගේ සේව්‍යයා ඔබගේ දායක මුදල් නිසි කලට ශ්‍රී ලංකා මහ බැංකුවට යවන්නේද යන්න පිළිබඳ සැළිකිලිමත් වන්න. එය ඔබගේ සේවක අයිතිවාසිකමකි.
- සේවා ස්ථානයෙන් ඉවත් වන විට පත්‍රය ලබා ගෙන එය සුරැකිව තබා ගන්න. ප්‍රතිලාභ ලබා ගැනීමේදී එය ඔබට පහසුවක් වනු ඇත
- ඔබ ප්‍රතිලාභ ලබා ගන්නා අවස්තාව වන විටත් ABH පත්‍රය ලියාපදිංචි වී නොමැති ආයතනය මඟින් ලබාගත් සේවා සහතිකය හෝ සම්පූරුණ කරන ලද ABH පත්‍රය ආයතනය අයත් වන දිස්ත්‍රික් කම්කරු කාර්යාලය මඟින් සෘහ හි තොරතුරු ඇතුළත් කළ බවට සටහනක් සහිතව ගෙවීම් අංශය වෙත යොමු කළ හැක.

ඉතිරි කොටස ලබන කාලාපයේ
මූලාශ්‍ර : කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවෙනි

# ප්‍රහේලිකා අංක --. 27

| | | | | |
|---|---|---|---|---|
| 1 ක | | 2 | | 3 |
| | ■ | | ■ | න් |
| 4 ක | | ම | 5 | ■ |
| | ■ | 6 | | 7 |
| 8 | | ■ | ■ | |

හරහට

1. සුළු අපනායන බෝගයකි.
4. ගැමියන්ගේ එදිනෙදා අවශ්‍යතා සඳහා ආයුධ තනා ගන්නා ස්ථානයකි.
6. නිවිතිවල අඩංගු පෝෂ්‍යදායි පාදාර්ථය.
8. අවාසි යන්නෙහි විරුද්ධාර්ථය

පහළට

1. මැයි පළමුවනදා මොවුන්ගේ දිනයකි.
2. වඩු කාර්මික ආයුද කට්ටලයට අයත් වුවකි.
3. ලෝහ වර්ගයකි.
5. ලකුණ යන අර්ථය දේ
7. බංගලාදේශයේ අගනුවරයි.

මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා
මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.
ඩාබිඳු සාමුහිකය
221, වෙළබඩ පාර, කටුනායක.

# පබැදුම

ටාගට් එක මදි උනාම බැනුම් අහගෙන
උනපු කඳුළු ඇස් අස්සේම හංගාගෙන
උදේ ඉඳන් හැන්දෑ වෙනකම්ම
කකුල් කඩිත්තුව හැදෙනකම්ම
“ලොකු උන්දෑල රජ කරන්න
අපේ වේල හොයාගන්න...”
යකඩ මැෂිම පාගන අම්මා !

අපේ ජීවිත ගැට ගහන්න
මට පාරක් හදලා දෙන්න
දවසෙම ඉස්පාසුවක් නැතුව
රෙදි කෑල්ලෙන් රටා මවලා
හවස ගෙදර ගොඩ උනාම
“ගාපන් පුතේ බාම් ටිකක්”
කකුල් අම්මේ රිදෙනවාද,
අහලා තවත් දුක් දෙන්න
මට බෑ අපේ අම්මේ...!

“අනික් මිනිස්සු හැඩට තියන අයගේ,
හිත් හරිම ලස්සනයි පුතේ..,
උන්දෑලගේ මෝස්තරේට
හරි ලස්සන ඇඳුම් මහන
මොකද අම්මේ රැටත් වැඩ
මම ඇහුවාම නුඹෙන් එහෙම
කියන්නේ නුඹ එහෙමයි මට,
නුඹම මහපු කමිසය මම
අදින්නේ හරි උජාරුවෙන්
වෙන වෙන අය හැඩ කරවන
නුඹේ හැඩය දිය වෙලා මැෂිම එක්කම
ඉතින් ඒ ලෝකයේ මට,
ලස්සනම හයියම හදවත...

ඒ අම්මාගේ හදවත

සුරජ ද සිල්වා



# මොකක්ද මේ C-190

1. වැඩ ලෝකය තුළ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම් දුරලීම හා සම්බන්ධ 190 වැනිස සම්මුතිය 2019 ජුනි මාසයේ 21 වැනි දින පවත්වන ලද සිය 108 වැනි සම්මේලනයේ දී ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් සම්මත කරන ලදී. වැඩ ලෝකය තුළ සිදු වන ප්‍රචණ්ඩත්වය හා හිරිහැර කිරීම් පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් විශේෂිතව කටයුතු කරනු ලබන ජාත්‍යන්තර ගිවිසුමක් මේ දක්වා නොතිබුණු අතර එසේ හෙයින් මෙම සම්මුතිය මඟින් නියාමන අඩුපාඩුවක් සපුරාලන ලබයි. තවද කම්කරු සංවිධානයේ රටවල් වෙත තම අධිකරණ බල සීමා තුළ මේ පිළිබඳ සංකල්ප විධිමත් කිරීමට සහ යම් ආකාරයක ඒකීය ස්වරූපයක් ඇති වචන මාලාවක් මීට අදාළව හඳුන්වාදීමට ද මෙම සම්මුතිය අදාල කර ගත හැක. වැඩ ලෝකය තුළ සිදුවන ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම් මඟින් පුද්ගලයෙකුගේ මානසික, ශාරිරික සහ ලිංගික සෞඛ්‍ය, අභිමානය, පවුල් සහ සාමාජ පරිසරයන් වෙත බලපෑමක් සිදු කරනු ලබන බව පිළිගන්නා අතරම රාජ්‍ය හා පෞද්ගලික සේවාවන් වල ගුණාත්මකභාවය කෙරෙහි සේවා ස්ථාන තුළ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම් මඟින් බලපෑමක් ඇති කරනු ලබන බව හඳුනාගැනීම සහ පුද්ගලයින් විසින් ශ්‍රම වෙළඳපොළට පිවිසුම, රැඳී සිටීම හා ඉදිරියට ගමන් කිරීම වළක්වනු ලබන බව සම්මේලනය මඟින් හඳුනා ගන්නා ලදි. කාන්තාවන් සහ අනිකුත් අවාසි සහගත තත්වයක සිටින ශ්‍රමිකයන්ට එරෙහිව වෙනස්කොට සැලකීමද බොහෝ විට ඒකී ප්‍රචණ්ඩත්වයට ඇතුළත් වේ.

2. වැඩ ලෝකය තුළ කාන්තාවන් හා පුරුෂයන් දෙපිරිසම ප්‍රචණ්ඩත්වයට සහ හිරිහැරයට ලක් වුවද, සේවා ස්ථානය තුළ දක්නට ලැබෙන සමාජ තත්වය සහ බල ව්‍යුහයන් හේතු කොට ගෙන කාන්තාවන් ප්‍රචණ්ඩත්වයට සහ හිරිහැරයට පාත්‍ර වීමට ඇති හැකියාව ඉහළ මට්ටමක ඇත. ජාත්‍යන්තර වෙළඳ සංගම් සම්මේලනය විසින් නිරීක්ෂණය කරනු ලබන පරිදි "ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ශ්‍රමිකයින්ගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම අතුරින් බෙහෙවින්ම විඳ දරා ගනු ලබන උල්ලංඝනය කිරීම් අතුරින් එකකි. සංඛ්‍යා දත්ත අනුව වයස අවරුදු 15ට වැඩි කාන්තාවන්ගෙන් 35% ගෝලීය වශයෙන් කාන්තාවන් මිලියන 818 ක් නිවසෙදී, තම ප්‍රජාව තුළ සහ සේවා ස්ථානය තුළ ලිංගික සහ ශාරීරික ප්‍රචණ්ඩත්වයන්ට ලක් වේ.

3. සියළුම අංශයන් තුළ විශේෂයෙන්ම සේවා ස්ථානය තුළ කාන්තාවන්ට එරෙහිව සිදු කරනු ලබන ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ විවාදය ඉදිරියට ගෙන යාමේ දී 190 වැනි සම්මුතිය ශ්‍රී ලංකාවට විශේෂයෙන්ම අදාල වේ. සේවා ස්ථානය තුළ සිදු කරනු ලබන ලිංගික හිංසනය සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා හැකියාව ලබා දීමට විශේෂ දණ්ඩන නීති සම්පාදනය කරනු ලැබ තිබුණාද, එවැනි හිරිහැර අඩු කිරීම සඳහා මෙම නීතිමය විධිවිධාන සුවිශේෂී ලෙස මැදිහත් වන බවක් පෙනී නොයයි. එසේ හෙයින් මෙම සම්මුතිය අපරානුමත කිරීම තුළින්

11 වන පිටුවට...

## 10 පිටුවෙන්... **මොකක්ද...**

සේවා ස්ථාන තුළදී විශේෂයෙන්ම කාන්තාවන් ඉලක්ක කිරීමක් සිදු කරනු ලබන සියළුම ආකාරවල හිංසන ක්‍රියාවන් සඳහා විසඳුම් දීමට හා ඒවා වැළැක්වීමට අවධානය යොමු කිරීම සුභවාදී කරුණකි.

4. ශ්‍රී ලංකාවේ සේවා ස්ථාන තුළ සිදුවන හිරිහැර සම්බන්ධයෙන් ප්‍රගාමී ලෙස විසඳුම් ලබා දීම සිදු කිරීමට වෙනත් හේතු ද ඇත. අධ්‍යාපනය, සාක්ෂරතාවය, කාන්තා විමුක්තිය හා කාන්තා ආයු අපේක්ෂාව සම්බන්ධයෙන් දකුණු ආසියාවේ හොඳම තත්වය ලබා ගනිමින් ශ්‍රී ලංකාව විසින් බෙහෙවින් අඩු මට්ටමක පැවතීම සැබැවින්ම පුදුමයට කරුණකි, මෙලෙස ශ්‍රම බලකාය තුළ කාන්තා සහාගීත්වය අඩුවීමට හේතු වූ සාධක සංකීර්ණ වුවද හිරිහැර වලින් තොර සේවා ස්ථානයන් තහවුරු කිරීම ශ්‍රම බලකාය තුළට කාන්තාවන් ආකර්ෂණය කර ගැනීම සඳහා වන පූර්ව කොන්දේසියක් ලෙස හඳුනාගෙන ඇත. (සෝලෝටැරොෆ් ඇතුළු පිරිස)

(NUSS වෘත්තීය සමිතිය විසින් වැඩ ලෝකය තුළ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම් දුරරීම පිළිබඳ සම්මුතිය හා අදාළ වන ශ්‍රී ලංකාවේ නීතියෙහි අඩුපාඩු පිළිබඳ විශ්ලේෂණය C-190 ඇසුරින්)

ඉතිරිය ලබන කාලාපයේ

## 2 පිටුවෙන්... **ඇය...**

කටයුතු සිදුකෙරුනේ එසේ ය. එම කටයුතුවල යෙදෙන අතර ම බොහෝ ස්ත්‍රීහු රේන්ද, බීරලු ගෙතීම, රෙදි විවීම, වට්ටි, පෙට්ටි, පැදුරු, මලු විවීම ආදී නොයෙකුත් කර්මාන්තවල නියැලෙමින්, ගොවිතැන් කටයුතුවලට සම්බන්ධ වෙමින් ආර්ථික සංවර්ධනයට රුකුල් දුන්හ. එහෙත් මෙම සාමාන්‍ය රටාවෙන් බැහැරව අප රටේ කාන්තාවන් විසින් ලොව සුවිශේෂී අවස්ථා සනිටුහන් කළ අවස්ථා ද නැත්තේ නොවේ.

ලොව ප්‍රථම අග්‍රාමාත්‍යවරිය අප රටින් බිහිවීම ම ඊට කදිම නිදසුනකි. ලෝක සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි සහ අධ්‍යාපන අංශයෙහි කාන්තාවන් ලබා ඇති ප්‍රගතිය මෙහිලා බෙහෙවින් ඉවහල් වී ඇත. ශ්‍රී ලංකාවේ ද ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තා දායකත්වය කැපී පෙනේ. මෙයට වසර ගණනාවකට පෙර අප රටේ විධිමත් අංශයේ රැකියා සහ වෘත්තීය අවස්ථා හිමිව පැවතියේ පිරිමි පාර්ශ්වයට පමණි. මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ බොහෝ ක්ෂේත්‍රවල කාන්තා නියෝජනය කැපී පෙනෙන මට්ටමකට පිවිස ඇත. ගුරු වෘත්තිය, හෙද සේවය වැනි බොහෝ වෘත්තීය ක්ෂේත්‍රවල බහුලව යෙදී සිටින්නේ කාන්තාවන් ය. එමෙන් ම, කාන්තාවන්ට සිදු කිරීමට අපහසු යැයි බොහෝ දෙනා පවසනා වරාය ක්ෂේත්‍රයේ ගුවන් හා ප්‍රවහන ක්ෂේත්‍රයේ ද රැකියාවන් සඳහා කාන්තාවන් මේ දශකයේ යොමු වී ඇත.

ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපදවාලීමෙහිලා කාන්තාවන්ගේ කැපකිරීම සුවිශාල ය. විශේෂයෙන්ම අපනයන ආදායම තුළ සියයට 40ක පමණ ප්‍රතිශතයක් නියෝජනය කරන ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුක්ත වූවන්ගෙන් සියයට 90ක් පමණ ම කාන්තාවන් ය. 1977 විවෘත ආර්ථිකයත් සමඟ නිදහස් වෙළද කාලප ගොඩනැගීමෙන් පසු එවායේ සේවයට රටේ සියලුම ග්‍රාමීය ප්‍රදේශන්ගෙන් කාන්තාවන් එම ප්‍රදේශ වලට සංක්‍රමණය විය. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උල්පත් බවට එම නිදහස් වෙළඳ කලාප පත්වුයේ කාන්තාවන්ගේ ශ්‍රම සුරා කමින්ය. දශක 4 ක පමණ ගත වී ඇතත් තවමත් එම කලාප වල කාන්තාවෝ තම අයිතිවාසිකම් වෙනුවෙන් ඉල්ලිම් කරති.

එපමණක් නොව ගෘහ සේවිකාවන් ලෙස විදෙස් ගත වන කාන්තාවන්ගේ ආදායම් ද මෙරට ආර්ථිකය නංවාලීමෙහිලා බෙහෙවින් ඉවහල් වෙයි. එමෙන් ම තේ සහ රබර් ආදී වතු වැවිලි අංශයේ සේවයේ නියුතු කම්කරු කාන්තාවෝ ද ස්වයං රැකියාවල නියුතු වූ කාන්තාවෝ ද මෙරට ආර්ථික සංවර්ධනයෙහිලා දායක වෙති. සංවර්ධනයෙහිලා කාන්තා ශ්‍රමයෙහි සහභාගිත්වය ඉහළ යෑම පොදුවේ ලොව බොහෝ රටවල දක්නට ලැබෙන ප්‍රවණතාවකි. වර්තමානයේ මේ පිළබඳ ඉහළ  නංවනු වස් කාන්තාවන් සවිබල ගැන්වීමට නොයෙකුත් ආකාරයෙන් පියවර ගනී. මෙසේ ලෝක ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය ඉහළ යෑම ඇතත් දේශපාලනය කිරීමට ඇති ඉඩ ප්‍රස්තාව සීමිතය. ඒ වෙනුවෙන් ඇය දිරිගැන්විය යුතුයි. 21 සියවසේ කාන්තාව දේශපාලනයට යොමු වී එම රාජ්‍යයේ තිරසාර වර්ධනයට අතිමහත් අයෝජනයකි. මේ උදා වී ඇත්තේ තොටිල්ල පදවන දෑතින් ලොව ආණ්ඩු කරවයි යන නැපෝලියන් අධිරාජ්‍යාගේ කියමන පසක් කළ යුතු කාලයයි.

මේ සියලු ආකාරයේ ස්ථර වල සිටින කාන්තාවන් තමන්ගේ අපේක්ෂාවන් වෙනුවෙන් සිහින දකින්න ඕන ඒ හීන වලට මහන්සියෙන් කැපකිරිමෙන් යන්න ඕනා. ජයග්‍රහණයට කෙටි මාර්ග නෑ වගේම ගහක කොළක උනත් නියමිත කාලයට කොළ මල් ගෙඩි හට ගන්නවානම් තමයි ලස්සන. කුමන රැකියාවක නිරත වන කාන්තාවන් වුවත් ඕනෑම ස්ත්‍රීයකට ආවේණික බලාපොරෝත්තු පවතී. කාන්තාව යනු තවදුරටත් ගෙදර ඉහුම් පිහුම් වලටවත් නිවසේ කටයුතු වලටම සිර විය යුතු චරිතයක් නොවේ. ගැහැණිය ලෝකය වෙනස් කරන අපූරු නිර්මාණයක්.

මනීෂා ප්‍රනාන්දු

# නායකත්ව පුහුණු වැඩසටහන් මාලාවේ තෙවැන්න



ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ හා කම්කරු අයිතීන් පිළිබඳ දැනුවත් කරමින් නායකත්ව පුහුණුව මඟින් කම්කරුවන්ගේ අයිතීන් දිනා ගැනීමට ඔවුන් අභිප්‍රේරණය කිරීම හා ශක්තිමත් නායකත්වයක් ආයතනය තුළ ගොඩනැගීම වෙනුවෙන් තරුණ කම්කරු ගැහැණු ළමුන් 20 දෙනෙකු හා පිරිමි ළමුන් 5 දෙනෙකුගේ පිරිසකින් යුතු කණ්ඩායමක් සමඟ ධාබිඳු සාමූහිකය සිදු කරන ලබන නායකත්ව පුහුණු වැඩසටහන් මාලාවේ තෙවැන්න මෙවර වව්නියා දිස්ත්‍රික්කයේ ද පැවැත්විය. මෙවර සැසියේදී කම්කරු නීති පිළිබඳ හා ආයතනයේ දී සේවකයින් වශයෙන් තමන් ඒ වෙනුවෙන් නැගී සිටිමින් කටයුතු කිරීම පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා විය. දෙසැම්බර් මස 14 හා 15 යන දෙදින පුරා වැඩසටහන වව්නියා සේවා ලංකා ආයතනයේ දී පැවැත්විය. මෙවර සම්පත් දායිකාවන් ලෙස යෝගේෂ්වරී මහත්මිය හා කර්තිහා මහත්මිය ඊට සහභාගී විය. ඔවුන් දෙදෙනාගේ සහායත් සමඟ ධාබිඳු සාමූහිකයේ වැඩසටහන් සම්බන්ධීකාරිකා චමිලා තුෂාරි මහත්මියගේ මෙහෙයවීම යටතේ සාර්ථකව දෙදින පුරා පැවැත්විණි. සමාජිකයින්ගේ උද්‍යෝගීමත් ඉදිරිපත් වීම් හා විවිධ කණ්ඩායම් ක්‍රියාකාරකම් හා ක්‍රීඩාවන් ඇතුව තෙවැනි වැඩසටහන නිමාවට පත්විය.



# ඇඟලුම් කම්කරු කාන්තාවන් සමඟ අවිධිමත් සාකච්ඡාවන් වව්නියාවේ දී හා කිලිනොච්චියේ දී

ධාබිඳු සාමූහිකය විසින් වව්නියාව හා කිලිනොච්චි ප්‍රදේශ වල ඇඟලුම් කාර්මාන්තශාලා වල සේවය කරන කම්කරු කාන්තාවන් 15 දෙනා බැගින් කාණ්ඩායම් 2 ක් සමගින් මෙම අවිධිමත් සාකච්ඡාවන් සිදු කරනු ලැබීය. ධාබිඳු සාමූහිකයේ ක්‍රියාකාරී නායකත්ව කම්කරු කාණ්ඩායම් විසින් මෙම අවිධිමත් සාකච්ඡාවන් සම්බන්ධීකරණය කටයුතු කළහ. ධාබිඳු සාමූහිකය සමඟ කටයුතු කිරීමට හඳුනාගත් මෙම පිරිසට කම්කරු නිතී හා වෘත්තිය සමිති අයිතිවාසිකම් කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ඔවුන්ගේ දැනුවත්භාවය පිළිබඳ තොරතුරු විමසීම හා ඔවුන්ගේ ආයතන තුළ මේ වන විට ඇති වී ඇති ගැටලු පිළිබඳ සාකච්ඡා විය. එම කෙටි අවිධිමත් හමුවන් හරහා ඔවුන් හඳුනාගැනීම හා මූලික කරුණු එදින සාකච්ඡා විය. ඉදිරියේ දී පැවැත්වීමට නියමිත බහු පාර්ශවිය සාකච්ඡාවන් වලදී අදාල පාර්ශව කරුවන්ට මෙම ගැටලු ඉදිරිපත් කිරීමට සුදානම් බව එහිදී ඔවුන්ට පවසා සිටියේය.



අංක: 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.